VERITÉ
විදසුන්

Originally Published in: [Mawbima,March ,2016 ]

## ලොව බොහෝ රටවලට අරුමයක් නොවන, අපට අරුමයක් වන සේවා වෙළඳ ගිවිසුම්

වෙරිටේ පයෙර්ෂණ ආයතනයේ මීට පෙර විදසුන් මගින් ශ්‍රී ලංකාව සිය අසල්වාසී ආසියානු රාජ්‍යයන් සමග සසඳන කල ද්විපාශර්වීය සහ බහුපාශර්වීය වෙළඳ ගිවිසුම් වලට එළඹීමේදී එම රටවලට වඩා බොහෝ පසුපසින් සිටින බවත් අත්සන් කරන ලද අතලොස්සක් වූ ගිවිසුම් වලින් ඉහළ ප්‍රතිලාභ ලබා ගැනීමට අසමත් වී ඇති බවත් පෙන්වා දෙන ලදී.


දැනට ලංකාවට ඇත්තේ භාණ්ඩ විකිණීම පිළිබඳ ගිවිසුම් පමණි. සේවා පිළිබඳ ගිවිසුම් සම්බන්ධයෙන් ගත කල ලංකාව ආසියාවේ අනෙකුත් රටවල් වලට වඩා බොහොමත්ම පසුපසින් සිටින බව මෙම විදසුන පෙන්වා දේ. මෙයින් අද බොහෝ ආන්දෝලනයකට ලක්ව තිබෙන "එට්කා" (ETCA) යනුවන් ප්‍රචලිත ඉන්දියාව සමග යෝජිත ආර්ථික හා තාක්ෂණික සහයෝගිතා ගිවිසුම (Economic and Technology Cooperation Agreement) පිළිබඳව පෙරවදනක් සැපයීමට බලාපොරොත්තු නොවේ. සේවා වෙළඳ ගිවිසුම් පිළිබඳ වත්මන් සාකච්චාවට යම් පසුබිමක් සපයා දීම මෙම විදසුනේ අරමුණයි. එට්කා ස්වරූපයේ ගිවිසුම් ශ්‍රී ලංකාවට අරුමක් වන නමුත්, ආසියාවේ අසල්වැසි රාජ්‍ය ගණනාවක්, පසුගිය දශකය තුළ, එවැනි වෙළඳ හා සේවා ගිවිසුම් වේලට එළඹීමට දැඩි උනන්දුවක් දක්වා ඇත.

ECTA සම්බන්ධව දැන් පවතින විවාදය වන්නේ ශ්‍රී ලංකාව ගිවිසුම අත්සන් කල යුතු ද නැද්ද යන්න යි. කෙසේ නමුත්, ඇසිය යුතු වැදගත්ම ප්‍රශ්නය නම් ශ්‍රී ලංකාවට මෙමගින් ලැබෙන වාසි සහ අවාසි මොනවාද යන්නයි. මෙවැනි විශ්ලේෂණයකදී ඉතා වැදගත් වන්නේ ගිවිසුමේ ව්‍යුහය හා වපසරිය මෙන්ම එය කළමණාකරණය කෙරෙන්නේ කෙසේද යන කරුණු වේ. දැනට එළඹ ඇති වෙළඳ සහයෝගිතා ගිවිසුම්වල අත්දැකීම් අපට යෝජනා කරන්නේ, පෙර  මෙන් නොව, මෙවැනි ගිවිසුම් වලින් ඇති කරගත හැකි වාසි උපරිමකරණය සහ අවාසි අවමකරනය පිණිස ප්‍රතිපත්තිසම්පාදකයන් මනා පෙර සූදානමක් සහිතව බුද්ධිමත්ව කටයුතු කළ යුතු බව ය.

### සේවා වෙළඳාම පිලිඹඳව පවතින රැල්ල

මෙම සියවස ඇරඹීමට මත්තෙන් ලොව තුළ සේවා වෙළඳාම පිළිබඳ වෙළඳ ගිවිසුම් අටක් පමණක් පැවතිනි. නමුත් සියවස ඇරඹුමත් සමග එය ක්‍රමිකව ඉහළ ගියේය. ලෝක වෙළඳ සංවිධානයට අනුව 2016 පෙබරවාරි පළමුවැනි දින වන විට සමස්ථ ලෝකය තුළ වූ භාණ්ඩ හා සේවා වෙළඳාම යන දෙඅංශයම ආවරණය වන වෙළඳ ගිවිසුම් ගණන 138කි. ඒ අනුව දැනට ක්‍රියාත්මක 419ක් වන සමස්ථ වෙළඳ ගිවිසුම් ප්‍රමාණයෙන් තුනෙන් එකක් සේවා ගිවිසුම් වෙයි.

_නැගෙනහිර ආසියාව පෙරමුණේ:_ ආසියානු රටවල් වෙළඳ ගිවිසුම් විෂයයෙහි ප්‍රමුඛස්ථානය ගනිති. නැගනෙහිර ආසියානු කලාපයේ රටවල් සේවා වෙළඳ ගිවිසුම් 65ක් හා බැදෙද්දී, යුරෝපීය රටවල් ගිවිසුම් 30ක් සමගත්  උතුරු ඇමරිකානු කලාපය ගිවිසුම් 27ක් සමගත් බැදී ඇත.



රූප සටහන 1: සේවා වෙළඳාම ගිවිසුම් වල වර්ධනය

මූලාශ්‍රය: ලෝක වෙළඳ සංවිධානය

*__දකුණු ආසියාව ඉබි ගමනේ!__*: නැගෙනහිර ආසියාව හා සැසඳීමේදී දකුණු ආසියානු රටවල් මේ සම්බන්ධයෙන් ඉබි ගමනක යන බවක් පෙනේ. සාක් (SAARC) සංවිධානයට අයත් දකුණු ආසියානු රටවල් සේවා පිළිබඳ ගිවිසුමකට 2010 වසරේදී එළඹ ඇත. කෙසේ නමුත්, අද වන තෙක්ම මෙම ගිවිසුම බලාත්මක නොවන්නේ සාමාජික රටවල් මෙම ගිවිසුම යටතේ වෙළඳාම් කළ හැකි සේවා අංශ තවමත් පෙළගස්වා අවසන්ව නැති බැවිනි.

පාකිස්ථානය අද වන විට සේවා ගිවිසුම් දෙකකට අත්සන් තබා ඇත. ඒ චීනය හා මැලේසියාව සමග ය. ඉන්දියාව දකුණු ආසියාවේ පෙරමුණේ පසුවන්නේ ගිවිසුම් 5කට එළඹෙමිනි. ශ්‍රී ලංකාව පසුගිය වසර දහය ඇතුළත එකදු අථර්වත් වෙළඳ ගිවිසුමකට හෝ අත්සන් තබා නැත.

*__නැගෙනහිර ආසියාව මුල්කරගත් ඉන්දියාවේ ආථරීක ප්‍රතිපත්ති රාමුව :__* ආසියා- පැසිපික් කලාපය සමග වන රාජ්‍ය තාන්ත්‍රික හා ආථරීක බැඳීම් ශක්තිමත් කරගනු පිණිස හිටපු ඉන්දීය අගමැති මන්මෝහන් සිං විසින් ගෙන එන ලද "නැගෙනහිර දෙස බලමු" යන මැයෙන් දියත් කල ප්‍රතිපත්තියෙහි එක් අංගයක් ලෙස ඉන්දියානු රජය 2005-2015 වකවානුව තුළ ප්‍රධාන විස්තීණර් (භාණ්ඩ, සේවා සහ ආයෝජන ඇතුලත්) ගිවිසුම් පහක් අත්සන් තබා ඇත. (සටහන 02).

| රූප සටහන 2: සේවා ආවරණය කෙරෙන ඉන්දීය ගිවිසුම් | |
|---|---|
| ගිවිසුම | වසර |
| ඉන්දියා- සිංගප්පූරු විස්තීණර් ආථරීක සහයෝගිතා ගිවිසුම | 2005 |
| ඉන්දියා- දකුණු කොරියා විස්තීණර් ආථරීක සබඳතා ගිවිසුම | 2010 |
| ඉන්දියා- මැලේසියා විස්තීණර් ආථරීක සහයෝගිතා ගිවිසුම | 2011 |
| ඉන්දියා- ජපාන විස්තීණර් ආථරීක සබඳතා ගිවිසුම | 2011 |
| ඉන්දියා – ආසියාන් (ASEAN) සංවිධාන ගිවිසුම (භාණ්ඩ – 2010, සේවා – 2015) (ආසියාන් (ASEAN) සංවිධානය – බෲනායි, කාම්බෝජය, ඉන්දුනීසියාව, ලාඕසය, මැලේසියාව, බුරුමය, පිලිපීනය, සිංගප්පූරුව, තායිලන්තය සහ වියට්නාමය යන අග්නිදිග ආසියානු රාජ්‍යයන්හි සහයෝගයෙන් සෑදූමලත් සංවිධානයකි.) | 2015 |

මූලාශ්‍රය: ආසියානු සංවර්ධන බැංකුව

වත්මන් ඉන්දීය අගමැති නරේන්ද්‍ර මෝඩි "නැගෙනහිර සමග වැඩ කරමු" නමින් මෙම ප්‍රතිපත්තිය නව දැක්මකින් තවත් ඉදිරියට ගෙන යාමට කටයුතු කරයි. මෙම ප්‍රතිපත්තියේ කොටසක් ලෙස ඉන්දියාව, ඉන්දුනීසියාව, තායිලන්තය, මොරිෂස්, නවසීලන්තය සහ ඕස්ට්‍රේලියාව යන ආසියානු රටවල් සමග වෙළඳ ගිවිසුම් සම්බන්ධ සාකච්ඡා ආරම්භ කොට ඇත. ඉන්දියාව, සිය රට හා චීනය, ජපානය, ඕස්ට්‍රේලියාව, දකුණු කොරියාව, නවසීලන්තය සහ ආසියාන් සංවිධානයේ සාමාජික රටවල් දහයක් අතර ගොඩ නැංවීමට යෝජිත කලාපීය සහයෝගිතා එකතුවෙහිද (RCEP) ක්‍රියාකාරී සාමාජිකයෙකු වෙයි.

ආසියාව සමග වෙළඳාම වර්ධනය

වියට්නාමය, තායිලන්තය සහ කාම්බෝජය වැනි ලෝක වෙළඳපළේදී සෘජුවම ශ්‍රී ලංකාව හා තරගයට එළඹෙන ආසියාන් සංවිධානයේ සාමාජික රටවල්, ඉන්දියාව හා චීනය යන රටවල් දෙක සමගම භාණ්ඩ හා සේවා යන දෙඅංශයම ඇතුළත් වෙළඳ ගිවිසුම් ඇති කරගෙන ඇත. මෙම ගිවිසුම් හරහා ලංකාවේ ව්‍යාපාරිකයන්ට නැති විශේෂ වරප්‍රසාද යටතේ ආසියාවේ විශාලතම හා වේගයෙන්ම වර්ධනය වන වෙළඳපළ දෙක සමග ගනුදෙනු කිරීමේ අයිතිය මෙම රටවල් හිමි කරගෙන තිබේ.

යුරෝපා සංගමය සහ ඇමරිකා එක්සත් ජනපදය වැනි බටහිර පිහිටි සාම්ප්‍රදායික වෙළඳපළවල් තවදුරටත් ලෝක වෙළඳාමේ ප්‍රධාන භූමිකා රඟදක්වනු ඇත. එනමුත් තවදුරටත්, ශ්‍රී ලංකාව මෙම වෙළඳපළවල් මත දැඩි ලෙස රැඳී සිටීම් අහිතකර විපාක දැනටමත් අත් විඳිමින් සිටී. මෙම වෙළඳපළේ (ප්‍රධාන කොටම ආර්ථික පසුබැසීමකට මුහුණ දී ඇති යුරෝපා සංගමය) ඉල්ලුම කඩාවැටීම, ශ්‍රී ලංකාවේ අපනයන වර්ධනය අඩාල කිරීමට ප්‍රධාන වූ එක් හේතුවකි. අපනයන වෙළඳපොල විවිධාංගීකරණය කිරීම සඳහා ආසියාව සමග වෙළඳාම ඉහළ දැමීමට ශ්‍රී ලංකාවට ක්‍රමෝපායන් අවශ්‍ය බව අවිවාදයෙන් පිළිගත යුතු කරුණකි.

සේවා වෙළඳ ගිවිසුම් කියන තරම් කළු ද?

රටක් තම රටෙහි අපනයනය සඳහා වන බාධක අඩු කිරීම තුලින් අපනයන වර්ධනය කරගැනීමේ අරමුණ පෙරදැරි කරගෙන ප්‍රධාන වශයෙන්ම අනෙකුත් රටවල් සමග වෙළඳ ගිවිසුම් වලට එළඹේ. එබැවින් වෙළඳ ගිවිසුමක වාසි ප්‍රධාන කොටම කරුණු දෙකක් මත රඳා පවතී. පළමුවැන්න, කුමන අංශ සහ ක්‍රියාකාරකම් මෙමගින් ආවරණය වන්නේ ද යන්න හා දෙවැන්න, වෙළඳාමට ඇති බාධක ගිවිසුම මගින් කොතරම් දුරට ඉවත් කිරීමට කටයුතු කරයිද යන්නයි.

ශ්‍රී ලංකාව සම්බන්ධ දැනට පවතින භාණ්ඩ වෙළඳ ගිවිසුම්වලදී පෙනී යන්නේ ගිවිසුම තුළ හා ඉන් පිටත වන නීතිරීති වෙළඳාමට සැලකිය යුතු බාධකයක් විය හැකි බව ය. 2000 වසරේ පටන් ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර භාණ්ඩ වෙළඳ ගිවිසුමක් බලපැවැත්වී ඇත. ඒ යටතේ භාණ්ඩ විශාල ප්‍රමාණයකට තීරු බදු රහිතව ඉන්දියාවට අපනයනය කිරීමට පහසුකම් සපයා ඇත. එය විශේෂයෙන්ම ආහාර නිෂ්පාදන අපනයනය සඳහා ලංකාවට සුවිශේෂී ප්‍රවේශයක් ලබද් දී ඇත. එහෙත් ආහාර විෂයයෙහි තීරු බදු රහිත ප්‍රවේශයක් ඇති නමුත් තීරු බදු නොවන බාධක නිසා වෙළඳාම අඩාල වී ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, ශ්‍රී ලාංකික අපනයනකරුවන් ඉන්දියාවට ඇතුල්වන ස්ථානයේදී ක්‍රියාත්මක වන අසීරු සහ කල් ගතවන ප්‍රමිති විමෂර්ණ ක්‍රියාපටිපාටි නිසා ඇතිවන ප්‍රමාදවීම් සහ අමතර පිරිවැය හේතුවෙන් තීරු බදු වාසිය නිෂේධනය වී ඇත.

තීරු බදු නොවන බාධක වළක්වාගත නොහැකි වීම සහ ඒ සඳහා ක්‍රියාත්මක නොවීම ගිවිසුම් සම්බන්ධයෙන් ලංකාවේ ව්‍යාපාරිකප්‍රජාව තුල දැඩි සෘණාත්මක ආකල්පයක් ඇතිකිරීමට හේතු වී ඇත. ප්‍රමිති සම්බන්ධ ගැටලුවට සරල සහ කඩිනම් විසඳුමක් ඇත. එනම් දෙරට අතර අනුකූලතා තක්සේරු පටිපාටීන් අන්‍යෝන්‍ය වශයෙන් හඳුනාගැනීම සඳහා ගිවිසුමක් ඇති කර ගැනීමයි. මෙය අනෙකුත් බොහෝ රටවල් දැනටමත් වෙළඳාම පහසු කිරීම සඳහා භාවිතා කරන සුලබ විසඳුමකි. අපනයනකරුවන් දැනට වසර ගණනාවක සිට මෙම ගැටලුව බලධාරීන්ගේ අවධානයට යොමු කලද එයට විසඳුමක් ලබාදීමට ඔවුන් තවමත් අසමත් වීම කණගාටුවට කරුණකි.

**මෙම උදාහරණය පෙන්වා දෙන්නේ ගිවිසුමක වාසි සහ අවාසි තක්සේරුවෙදී වඩා තීරණාත්මකම කරුණ වන්නේ ගිවිසුමේ  ව්‍යුහය හා වපසරිය බවයි. එනම් එම ගිවිසුම සැබවින්ම ලංකාවට අපනයන කල හැකි භාණ්ඩ සහ සේවා වලට යහපත් ප්‍රවේශයක් ලබා දෙන්නේද සහ ලංකාවට අවාසි අවම කර ගැනීමට ගිවුසුම හරහා ගැලපෙන ආරක්ෂණ විධික්‍රම සළසා දෙන්නේද  යන්න මෙහිදී ඉතා වැදගත් වේ.  එට්කා ගිවිසුම කියන තරම් කළුද නැතිද යන්න තීරණය වන්නේ මෙම කරුණු මත බැවින් ගිවිසුම අත්සන් කරනවාද  නැතිද යන පටු විවාදයෙන් බැහැර වී, වත්මන් විවාදයන් තුල  මෙම කරුණු වඩාත් සාකච්චාවට ලක් කිරීම, වැදගත් වේ.**

**වෙරිටේ පර්යේෂණ ආයතනය යනු, ආර්ථික විද්‍යාව, නීතිය, දේශපාලනය සහ ජන මාධ්‍යය විෂයයෙහි ඉහළ මට්ටමේ තීරකවරුන් සඳහා උපායමාර්ගික විශ්ලේෂණ සපයා දෙන, කොළඹ පිහිටි, ස්වාධීන බුද්ධි පර්ෂදයකි.**
**ප්‍රතිචාර ඇගයේ. විද්‍යුත් තැපැල:** publications@veriteresearch.org